# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,802 - 2013 මාර්තු 15 වැනි සිකුරාදා - 2013.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 752 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ජන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 779 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අප්‍රේල් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මාර්තු මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

 - B 80700— 7,100 (2013/03)
F 1 –

# තනතුරු - ඇබෑර්තු

## අක්මීමන ප්‍රාදේශීය සභාව

අක්මීමන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| මාර්ග කම්කරු III | 02 | රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 | පස්වන ශ්‍රේණිය සමත් විය යුතු ය. |

*02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය;
(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය;
(iii) අයදුම්කරු අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය ; (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුයි) ;
(iv) අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය ;
(vi) අක්මීමන ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ ;
(vii) අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය;
(viii) රජයේ /පළාත් පාලන හා සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු ය.

*03. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිර ය;
(ii) වැන්දඹු අනත්දරු අරමුදලට දායක විය යුතු ය;
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන්නේ ය;
(iv) මෙම බඳවා ගැනීම් කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, මධ්‍යම රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් හෝ දකුණු පළාත් රාජ්‍ය සේවක කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතු ය.

*04. බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අය තෝරා ගැනේ.
(ii) අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල්පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.
  (i) උප්පැන්න සහතිකය ;
  (ii) අධ්‍යාපන සහතික;
  (iii) පදිංචිය සනාථ කිරීම පිණිස ග්‍රාම සේවා නිලධාරීගේ සහතිකය;
  (iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක්;
  (v) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතිකයක් තිබේ නම් එම සහතිකය.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*06. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කර 2013.04.10 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, අක්මීමන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල අක්මීමන ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

අනිල් ප්‍රියදර්ශන ජාගොඩ,
සභාපති,
අක්මීමණ ප්‍රාදේශීය සභාව.

2013ක් වූ පෙබරවාරි මස 21 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**අක්මීමන ප්‍රාදේශීය සභාව**

*.................................. තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
2. ස්ථිර ලිපිනය:——————————.
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
4. උපන් දිනය:
   වර්ෂය :——————————.මාසය:——————————. දිනය:——————————.
5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස ඃ
   අවුරුදු :——————————.මාස:——————————. දින:——————————.
6. විවාහක/අවිවාහක බව:——————————.
7. ස්ත්‍රී පුරුෂ භාවය :——————————.
8. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? එසේනම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද ? යන වග:——————————.
8. අධ්‍යාපන සුදුසුකම් :——————————.
9. වෘත්තීය සුදුසුකම් :——————————.
10. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්:

   (i) දැනට දරන තනතුර :——————————;
   (ii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/පදනම මත ද) :——————————.
   (iii) එම තනතුරට පත්වූ දිනය:——————————;
   (iv) ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වැරදිකරු කරනු ලැබ තිබේ ද ? :——————————;

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

.................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ .................................................. වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරනු ඇත. ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————————.

03-625

---

**ජා ඇල නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, ජාඇල නගර සභාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

උපලේඛනය

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | රියදුරු II (ආ) | 03 | PL-3-2006 A<br>රු. 12,470 - 10 x 130 - 10 x 145- 10 x 160 - 12 x 170 - රු.18,860. | අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත්වී තිබිය යුතු ය. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වයක් පිළිබඳව සහතිකයක් තිබිය යුතු ය. වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | (සහතික මගින් සනාථ කළ යුතුය.) අවම උස අඩි 5ක් විය යුතුය. දිවා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. |
| 02. | විදුලි කාර්මික | 01 | PL - 2 - 2006A<br>(රු.12,210-10x130-10x145<br>10x160-12x170-රු.18,600) | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*<br><br>අවම වශයෙන් 8 ශ්‍රේණිය 9 වසර සමත් වී තිබිය යුතුය. තනතුරට අදාළව අවම වශයෙන් වසර 2ක පළපුරුද්දක් ලබාතිබිය යුතුය. (රජයේ ලියාපදිංචි ආයතනයක)<br><br>*බාහිර අයදුම්කරුවන් සඳහා*<br><br>ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02ක් සමත් විය යුතුය. අවම වශයෙන් වසර 2ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (රජයේ ලියාපදිංචි ආයතනයක) |
| 03. | යන්ත්‍ර ක්‍රියකාරු | 01 | PL - 2 - 2006A<br>(රු.12,210-10x130-10x145<br>10x160-12x170-රු.18,600) | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා.පෙළ)/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02ක් සමත් වී තිබිය යුයතුය.<br><br>වෘත්තීය හා වෙනත් සුදුසුකම් :-<br><br>i. තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32ට වඩා ගෙනයාමට බලපත්‍ර ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි.<br><br>ii. අවම උස අඩි 5 අඟල් 6ක් විය යුතුය.<br><br>iii. බැකෝ යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීණතාවයක් ලබා තිබීම.<br><br>vi. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය. |
| 04. | ආදාහනාගාර ක්‍රියකාරු | 01 | PL 2 - 2006A<br>(රු.12,210-10x130-10x145<br>10x160-12x170-රු.18,600) | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02ක් සමත් විය යුතුය.<br><br>අවම වශයෙන් වසර 2ක පළපුරුද්දක් ලබා තිබිය යුතය. (රජයේ ලියාපදිංචි ආයතනයක) |
| 05. | කාර්යාල කාර්ය සහායක | 01 | PL - 1- 2006A<br>(රු.11,730-10x120-10x130<br>10x145-12x160-රු.17,600) | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී එක් වරක දී, කවර හෝ විෂයයන් 6ක් සමත් වී තිබිය යුතුය. |
| 06. | ආදාහනාගාර සහයක | 01 | PL - 1- 2006A<br>(රු.11,730-10x120-10x130<br>10x145-12x160-රු.17,600) | අවම වශයෙන් 8 ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබිය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 07. | ක්‍රීඩාභූමි භාරකරු | 01 | PL - 1- 2006A රු.11,730-10x120-10x130 10x145-12x160-රු.17,600 | අවම වශයෙන් 8 ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබිය යුතුය. |
| 08. | වැඩක්ෂේත්‍ර/කම්කරු | 08 | PL - 1- 2006A රු.11,730-10x120-10x130 10x145-12x160-රු.17,600 | 5 වැනි ශ්‍රේණිය/6 වසර සමත්වී තිබිය යුතුය. |
| 09. | සෞඛ්‍ය කම්කරු | 15 | PL - 1- 2006A රු.11,730-10x120-10x130 10x145-12x160-රු.17,600 | අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු නොලැබේ. |

*01. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

1. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
2. විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
3. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ අවම වශයෙන් වසර 3ක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
(රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත)
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ, පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම නොලැබූ අයෙකු විය යුතුය.

*02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුරු ස්ථිර. විශ්‍රාව වැටුප් සහිතය.
2. අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
3. වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාව වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
4. මෙම බඳවා ගැනිමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභාව හෝ ජාඇල නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර "ලේකම්, නගර සභාව, ජාඇල" යන ලිපිනයට 2013.04.03 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

දැනටමත් මෙම ආයතනයේ ආදේශක, අනියම් හෝ තාවකාලික සේවය කරන අයදුම්කරුවන් සම්බන්ධයෙන් ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල තනතුරු සඳහා බඳවා ගැනීම් හා උසස් කිරීමේ ව්‍යවස්ථා යටතේ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2009 අනුව පුරප්පාඩු පිරවීමේ දී අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ඇත.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල සහතික කල පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
4. මැතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය ;
5. මැතක දී ලබාගත් චරිත සහතික 02ක්;
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;
7. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික.

මෙම අයැදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරේ දී හෝ බඳවාගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල ලේකම් සතු වේ.

එල්. එච්. සී. ශ්‍රියානි,
ලේකම්,
ජාඇල නගර සභාව.

2013 ක් වූ පෙබරවාරි මස 22 වැනි දින,
ජා ඇල නගර සභා කාර්යාලය,
ජාඇල.

*ආදර්ශ අයැදුම්පත*

**ජාඇල නගර සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ.............................................................................................. තනතුර සඳහා අයැදුම්පත්‍රය***

1. මුලකුරු සමග නම :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
3. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
5. ස්ථිර ලිපිනය :——————————.
6. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :——————————.
7. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :——————————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
9. උපන් දිනය : වර්ෂය:——————————. මාසය:——————————. දිනය:——————————.
10. 2013.03.15 දිනට වයස : අවුරුදු:——————————. මාස:——————————. දින:——————————.
11. අධ්‍යාපන සුදුසුකම් :——————————.
12. වෘත්තීය සුදුසුකම් :——————————.
13. වෙනත් සුදුසුකම් :——————————.
14. පළපුරුද්ද :——————————.
15. ඔබ කවරදාක හෝ උසාවියක දී වරදකරුවෙකු කර තිබේ ද යන වග. :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ පසුව හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු හා සේවයෙන් පහ කිරීමට යටත් වන බව හොඳාකාරවම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ........................................................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ /දෙපාර්තමේන්තුවේ ........................................................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————————.

03-620

## මොරටුව මහ නගර සභාව

මොරටුව මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර (පිරිමි) පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | අංශභාර ගිනි නිලධාරි | 01 | RS-2 රා.පරි.ච.ලේ 06/2006 (iv) අනුව | රු. 15,850-7x180-2x240 -8x320-17x375- -රු.26,500 | 01. පළාත් රාජ්‍ය සේවයේ, ගිනි නිවීමේ කටයුතු පිළිබඳ අවුරුදු 10කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතු ය. මින් අවුරුදු 3කට නොඅඩු කාලසීමාවක් තනතුරේ ස්ථිර කරනු ලැබූ මූලික ගිනිභටයෙකු වශයෙන් සතුටුදායක සේවයක් තිබිය යුතු ය.<br>02. බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව හෝ බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් බලය පවරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන තනතුරට අදාළ වෘත්තීය පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම.<br>03. *වයස් සීමාව.-* වයස අවුරුදු 25ත් 45ත් අතර විය යුතු ය.<br>04. *ලිඛිත පරීක්ෂණය*<br>*විෂය නිර්දේශය :-*<br>විද්‍යාව, තාක්ෂණය, අන්ත්‍රාදායක ද්‍රව්‍ය, විධානය හා නායකත්වය, ස්ථාන පාලනය හා කළමනාකරණය. |
| 02. | මූලික ගිනිභට | 04 | RS-2 රා.පරි.ච.ලේ 06/2006 (iv) අනුව | රු. 15,850-7x180-2x240 -8x320-17x375- -රු.26,500 | 01. රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සේවයේ තනතුරේ ස්ථිර කරන ලද පළමු වැනි පංතියේ ගිනිභටයෙකු ලෙස අවම වශයෙන් වසර 3ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය.<br>02. බස්නාහිර පළාතේ අදාළ පළාත්පාලන ආයතනය හෝ එම පළාත් පාලන ආයතනය විසින් බලය පවරනු ලැබූ ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදාළ වෘත්තීය පාඨමාලාවක් හදාරා සමත් වී තිබිය යුතු ය.<br>03. *වයස් සීමාව.-* වයස අවුරුදු 22ත් 45ත් අතර විය යුතු ය.<br>04. *ලිඛිත පරීක්ෂණය :*<br>පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය.<br>*ප්‍රශ්න පත්‍රයේ විෂය ක්ෂේත්‍රය :*<br>විද්‍යාව, තාක්ෂණය, අන්ත්‍රාදායක ද්‍රව්‍ය, විධානය හා නායකත්වය. |
| 03. | යාන්ත්‍රික ගිනිභට | 09 | RS-1 රා.පරි.ච.ලේ 06/2006 (iv)A අනුව | රු. 14,280-7x145-10x180 -17x240-21x175- -රු.21,175 | 01. රාජ්‍ය සේවයේ , පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සේවයේ තනතුරේ ස්ථිර කරනු ලැබූ ගිනිභටයෙකු ලෙස අවම වශයෙන් වසර 4ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය.<br>02. බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍රයක් තිබිය යුතු ය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | 03. බර වාහන පැදවීම පිළිබඳ අවම වශයෙන් අවුරුදු 02ක පළපුරුද්දක් තිබිය යුතුය.<br>04. බස්නාහිර පළාතේ ආදල පළාත්පාලන ආයතනයේ හෝ එම පළාත් පාලන ආයතනය විසින් බලය පවරනු ලැබූ ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදාල වෘත්තීය පාඨමාලාවක් හදාරා සමත් වී තිබිය යුතුය.<br>03. වයස් සීමාව - වයස අවුරුදු 22ත් 45ත් අතර විය යුතුය.<br>04. *ලිඛිත පරීක්ෂණය*<br>පැය 1 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය.<br>*ප්‍රශ්න පත්‍රයේ විෂය ක්ෂේත්‍රය*<br>විද්‍යාව, තාක්ෂණය |
| 04. | ගිනිහට | 24 | RS-1<br>රා.පරි.ච.ලේ 06/2006 (iv)A අනුව | රු. 14,280-7x145-10x180 -17x240-21x175- -රු.21,175 | 01. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අඩු වශයෙන් වාර දෙකකදී සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුලු විෂයයන් 06කින් සමත්වී තිබිය යුතු අතර විෂයයන් 05ක් එක් අවස්ථාවක දී සමත්වී තිබිය යුතුය.<br>02. අයදුම්කරුවන් අවිවාහක විය යුතුය.<br>03. වයස් සීමාව - අවුරුදු 19ත් 25ත් අතර විය යුතුය.<br>04. ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් පවත්වනු ලබන ගිනිහට පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන්ට පමණක් වයස් සීමාව අවුරුදු 35 ක් දක්වා දීර්ඝ කරනු ලැබේ.<br>05. *ලිඛිත පරීක්ෂණය*<br>1. සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 1ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය.<br>2. ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා අවස්ථාවෝචිත යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ. |

*පොදුවේ සියළුම අයදුම්කරුවන් වෙත තිබිය යුතු සුදුසුකම් :-*

01. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට බස්නාහිර පළාත තුළ පූර්වාසන්න වසර 3ක අවම ස්ථිර පදිංචියක් තිබිය යුතුය. ;
03. උස අඩි 5 යි අඟල් 4ක අවම උසකින් යුක්ත විය යුතුය.
04. බර රාත්තල් 125ක අවම බරකින් යුක්ත විය යුතුය.
05. යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.
06. යම්කිසි වරදකට අධිකරණය මගින් දඬුවම් ලැබූවකු හො කෙදිනක හෝ උසාවියකදී වරදකරුවෙකු වී නොමැති අයෙකු හෝ රාජ්‍ය සේවයෙන් පහ කළ අයෙකු නොවිය යුතුය.
07. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයන්ට මෙහි සඳහන් වයස් සීමාවන් අදාළ නොවේ.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

01. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;
02. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය ;
03. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, හෝ මොරටුව මහ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය. මෙම තනතුරේ සේවය බස්නාහිර පළාත තුලට සීමාවේ.

04. මෙම තනතුරුවලට බඳවා ගනු ලබන්නේ ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල මත තෝරාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුවය.

*ගිනිභට තනතුර සඳහා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(අ) ගිනිභටයෙකු වශයෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතුය. පුහුණු කාල සීමාව තුලදී වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟාවිය නොහැකි වන පුහුණුවන්නන් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කිරීම පත්වීම් බලධාරියාට කළ හැකිය.

(ආ) ගිනිභටයෙකු වශයෙන් පුහුණු වන කාල සීමාව තුළදී රු. 3,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) පුහුණුව සාර්ථකව නිමකරනු ලබන අභ්‍යාසලාභීන් පළාත් රාජ්‍ය සේවයේ ගිනිභට තනතුරට අදාළ වැටුප් පරිමාණය මත පත්කරනු ලැබේ.

(ඈ) පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 05ක කාල සීමාවක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන බවට රු. 10,000 ක වටිනාකමකින් යුතු බැඳුම්කරයක් අත්සන් කළ යුතුය.

(ඉ) ගිනිභටයෙකු වශයෙන් පුහුණුව ආරම්භ කිරීමට පෙර සියළුම අභ්‍යාසලාභීන් වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්විය යුතුය.

(ඊ) ගිනිභටයන් වශයෙන් පත්වීම් ලැබූවිට එම පත්වීම්ලාභීන් මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ පදිංචිවීම අනිවාර්යවේ.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :-*

01. ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් ආදර්ශ අයදුම්පත්‍ර අනුව අයදුම්පත් සකස් කොට 2013.04.15 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නාගරික කොමසාරිස්, මොරටුව මහ නගර සභාව, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තව ද අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුයි. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

02. රාජ්‍ය/බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ /රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවකයන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා මගින් සහතික කර එවිය යුතුය.

03. අයදුම්පත් භාර ගැනීමෙන් අනතුරුව විභාගය පැවැත්වෙන දිනය අයදුම්කරුවන්ට පෞද්ගලිකව දැනුම් දෙනු ලැබේ. විභාගය පැවැත්වීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය නාගරික කොමසාරිස් සතුය.

04. තවද අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

එස්. කේ. ජයසුන්දර,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2013ක් වූ පෙබරවාරි මස 27 වැනි දින,
මොරටුව මහ නගර සභාව,
මොරටුව දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මොරටුව මහ නගර සභාව - මොරටුව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහ නගර සභාවේ ………………..තනතුර සඳහා අයදුම්පත***

01. *(අ)* මුලකුරු සමඟ නම :————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
02. *(අ)* උපන් දිනය හා උපන් ස්ථානය :————.
*(ආ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.
03. ජාතික හැඳුනුම්පත් අංකය :————.
04. විවාහක/අවිවාහක බව :————.
05. ස්ථිර ලිපිනය :————.

06. දුරකථන අංකය :————.
07. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
පදිංචි ස්ථානය අයත් ග්‍රාම නිලධාරි වසම :————.
08. බස්නාහිර පළාත තුළ කාලසීමාව :————.
09. උස අඩි :————. අඟල් :————.
10. බර : රාත්තල් :————.
11. අධ්‍යාපන සුදුසුකම් :
ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් අමුණන්න.

අ.පොස. සා.පෙළ විභාගයේ වර්ෂය :————.

| *විෂයයන්* | *සාමාර්ථය* | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *1.* | | *6.* | |
| *2.* | | *7.* | |
| *3.* | | *8.* | |
| *4.* | | *9.* | |
| *5.* | | *10.* | |

12. වෘත්තීය සුදුසුකම් :————.
13. වෙනත් සුදුසුකම් :————.
14. ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනක හෝ උසාවියක දී වරදකරුවෙකු වී තිබේ ද ? (වරදකරුවෙකු වී තිබේ නම් එහි ස්වභාවය හා ලද දඬුවම් පැහැදිලිව සඳහන් කරන්න) :————.
15. ඔබ රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථා හෝ වෙනත් සේවාවක සේවයේ යෙදී සිට එම සේවයෙන් පහකළ හෝ ඉල්ලා අස්වී ද යන වග (එසේ නම් ඊට හේතු) :————.

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට අනාවරණය වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවත්, සහ පත්වීම ලැබීමෙන් පසු එය අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක හෝ සංස්ථාවක සේවයේ නියුතු අයදුම්කරුවන් පහත දැක්වෙන සහතිකය සමඟ අයදුම්පත්‍රය සමඟ එවිය යුතු ය.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................................................. නමැති අයදුම්කරු .................................................. වැනි දින සිට මෙම ආයතනයේ සේවය කරන අතර, වැඩ හා හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඉහත සඳහන් අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම ආයතනයේ සේවයෙන් මුදා හැරීම කළ හැකි බව ද දනිමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන (නිල මුද්‍රාව).

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

03-646/2

## මොරටුව මහ නගර සභාව

මොරටුව මහ නගර සභාවේ තනතුරු ඇබෑර්තු පිරවීම සම්බන්ධයෙන් 2012.10.12 වැනි දින පළාත් පාලන ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම අවලංගු කරන අතර පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් නැවත අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | වෙළඳසල් පරිපාලක II ශ්‍රේණිය | 04 | MN 1-2006A | රු. 13,120-10x145-11x170 -10x240-10x320- -රු.22,040 | (අ) දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 04කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු ය<br>සහ<br>(ආ) මනා පෞරුෂයකින් යුක්ත විය යුතු අතර සිංහල, දෙමළ භාෂා කථා කිරීමට හැකියාව තිබිය යුතු ය. |
| 02 | සෞඛ්‍ය පරිපාලක (II ශ්‍රේණිය) | 01 | MN 1-2006A | රු. 13,120-10x145-11x170 -10x240-10x320- රු.22,040 | (අ) සිංහල/දෙමළ සහ ගණිතය /අංක ගණිතය/වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව ශාරීරික විද්‍යාව/ සෞඛ්‍ය විද්‍යාව/විද්‍යාව ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 05කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වී තිබීම.<br>හෝ<br>(ආ) සිංහල/දෙමළ, ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුළුව විෂයයන් 6කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගෙයන් සාමාර්ථය ලබා සිටින පළාත් ආයතනයට ස්ථිර තනතුරක් දරන්නෙකු<br>හෝ<br>(ඇ) පළාත් පාලන ආයතනයක අවුරුදු 10කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි පන්තිය සාමාර්ථය ලබා තිබීම. |
| 03 | ආදාහනාගාර සහායක III ශ්‍රේණිය | 04 | PL1-2006A | රු.11,730-10x120-10x130 10x145-12x160-රු.17,600 | (අ) අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත්වී තිබිය යුතු ය. |
| 04 | වැඩ /ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 23 | PL1-2006A | රු.11,730-10x120-10x130 10x145-12x160-රු.17,600 | (අ) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබිය යුතු ය. |
| 05 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 22 | PL1-2006A | රු.11,730-10x120-10x130 10x145-12x160-රු.17,600 | අධ්‍යාපන සුදුසුකම් අවශ්‍ය නොවේ |
| 06 | රියැදුරු II ආ සැහැල්ලු වාහන | 09 | PL3-2006A | රු.12,470-10x130-10x145 10x160-12x170-රු.18,860 | I. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් අටවැනි ශ්‍රේණිය/නවය වසර සමත්වී තිබිය යුතු ය.<br>II. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | III. වාහන රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)<br>IV. අවම උස අඩි 5ක් විය යුතුය.<br>V. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br>VI. මාර්ගනීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. |

*බඳවා ගැනීමේ කොන්දේසි :-*

01. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.
02. අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
03. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට වයස් සීමාව බලනොපානු ඇත.)
04. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
05. සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
06. වෙළඳසැල් පරිපාලක හා සෞඛ්‍ය පරිපාලක තනතුරු සඳහා පමණක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ප්‍රකාර ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 1.30ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කරන පැය 1ක ප්‍රශ්න පත්‍රයකි.
07. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු හෝ දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
08. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.
09. මොරටුව මහ නගර සභා සීමාව තුළ පදිංචි හා දැනට මොරටුව නගර සභාවේ සේවයේ නියුක්ත ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත හෝ ව්‍යාපෘතියක් යටතේ සේවයේ යෙදී සිටින සේවකයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. ;
02. ස්ථිර පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ. ;
03. මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා බස්නාහිර පළාත් සභාව වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :-*

01. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු අතර, අයදුම්පත් 2013.04.15 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මොරටුව" යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් පමණක් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

02. අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

    (අ) උප්පැන්න සහතිකය,
    (ආ) අධ්‍යාපන සහතික,
    (ඇ) ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය,
    (ඉ) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.
    (එක් සහතිකයක් ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතුය.)

එස්. කේ. ජයසුන්දර,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2013ක් වූ පෙබරවාරි මස 27 වැනි දින,
මොරටුව.
මොරටුව මහ නගර සභාවේ දී ය.

### ආදර්ශ අයදුම්පත්‍රය

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහ නගර සභාවේ ………………තනතුර සඳහා අයදුම්පත*

01. මුලකුරු සමඟ නම :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
03. ස්ථිර ලිපිනය :————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :————.
06. උපන් දිනය ඃ
    අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ
    අවුරුදු :————. මාස :————. දින :————.
08. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
09. විවාහක/අවිවාහක බව :————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන්ද ? ලියාපදිංචියෙන් ද? :————.
11. අධ්‍යාපන සුදුසුකම් :————.
12. වෙනත් සුදුසුකම් :————.
13. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඒ පිළිබඳ විස්තර :————.
    I. දැනට දරන තනතුර :————.
    II. ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යනවග :————.
    III. එම තනතුරට පත්වූ දිනය :————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද ? :————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

මෙම ඉල්ලුම්කරු/කාරිය වන .................................. මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ...................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.

03-646/1

### ගම්පහ මහ නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වැඩ ක්‍ෂේත්‍ර පරිපාලක II/ සෞඛ්‍ය පරිපාලක II/ වෙළඳපොල පරිපාලක II සඳහා බඳවා ගැනීම - 2013

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගම්පහ මහා නගර සභාවේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරන ලද බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. වැඩ/ක්ෂේත්‍ර පරිපාලක II
2. සෞඛ්‍ය පරිපාලක II
3. වෙළඳපොල පරිපාලක II

*අදාල වැටුප් ක්‍රමය :* රු. 13,120-145 x 10-170 x 11-240 x 10-320 x 100-රු.22,040
(හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්‍ෂමතා කඩඉමකි)

*(අ)* අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම (සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා අයදුම්කරන්නන් ඉහත විභාගයේදී සෞඛ්‍ය විද්‍යාව සමත්වී තිබිය යුතුය.)

*හෝ*

*(ආ)* ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.

*හෝ*

*(අ)* පළාත් පාලන ආයතනයක අවුරුදු 10ට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 08 වන පන්තිය සාමාර්ථය ලබා තිබීම.

*අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

(1) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(2) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(3) 2013.03.31 දිනට වයස අවුරුදු 18 නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. දැනට පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(4) දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම ලැබූවෙකු නොවිය යුතුය.

(5) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත වි යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :-*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/96 අනුකූලව පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකින් ඉහළම ලකුණු මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය :-

(අ) සාමාන්‍ය බුද්ධිය පරීක්‍ෂා කිරීම සඳහා වන පැය 1 1/2 ප්‍රශ්න පත්‍රයක් ; සහ

(ආ) සාමාන්‍ය දැනුම පරීක්‍ෂා කිරීම සඳහා වන පැය 01 ප්‍රශ්න පත්‍රයක්

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාව හෝ ගම්පහ මහා නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියළු සේවකයින් බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම්කළ යුතු ආකාරය :-*

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2013.03.25 දිනට පෙර "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, ගම්පහ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.(දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අයදුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත් එවනු ලබන සියළුදෙනා වෙත ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන දිනය පසුව දන්වනු ලැබේ.

කේ. එම්. ඩබ්ලිව්. ප්‍රේමචන්ද්‍ර,
නාගරික කොමසාරිස්,
ගම්පහ මහ නගර සභාව - ගම්පහ.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
ගම්පහ මහ නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ගම්පහ මහා නගර සභාව***

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වැඩ ක්ෂේත්‍ර පරිපාලකII/ සෞඛ්‍ය පරිපාලකII/ වෙළඳපොළ පරිපාලක II සඳහා බඳවා ගැනීම - 2013**

1. මුලකුරු සමඟ නම :—————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
3. ස්ථිර ලිපිනය :—————.
4. ස්ත්‍රී /පුරුෂ භාවය :—————.
5. උපන් දිනය :
   අවුරුද්ද :—————, මාසය :—————, දිනය :—————.
6. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචි වීමෙන් ද ? :—————.
7. අධ්‍යාපන සුදුසුකම් :
   (1) අ. පො. ස. (සා.පෙළ) විභාගය :—————.
   සමත් වර්ෂය හා විභාග අංකය :—————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

   (ii) වෙනත් සුදුසුකම් :—————.
8. වෘත්තීය සුදුසුකම් :—————.
9. සේවා පළපුරුද්ද :—————.
   (i) දැනට සේවය කරන ආයතනය:——————————;
   (ii) දැනට දරන තනතුර :——————————.
   (iii) එම තනතුරට පත්වූ දිනය:——————————;
   (iv) පෙර සේවය කරන ලද ස්ථානයේ දරන ලද තනතුර :——————————;

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර, නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ........................................................ මයා/මිය/මෙනෙවිය මෙම ආයතනයේ ............................................. වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොන ආකාරයේ හෝ නිත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————,
ආයතන ප්‍රධානියා.

ආයතනය :—————.
නම :—————.
පදවිය :—————.
දිනය :—————.

03-708/1

## ගම්පහ මහා නගර සභාව

### රියදුරු "11" ආ ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම

ගම්පහ මහා නගර සභාවේ රියදුරු "11" ආ ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි පිරිමි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුර* .- බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ රියදුරු 11 "ආ" ශ්‍රේණිය
02. *වැටුප් පරිමාණය* : රු. 12,470-130 x 10 -145x 10 - 160 x 10-70 x 12- රු.18,860

03. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(ii) අයදුම්පත් භාරගන්නා දිනට ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න වසර 03කට නොඅඩු ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය.

(iii) තනතුර භාරගන්නා අවසන් දිනය ඇතුළත් මාසයේ සිට පූර්වාසන්න මාසයේ අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු අවුරුදු 45 ට නොවැඩි අයෙකු විය යුතු ය. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(iv) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසැලකින් අවම වශයෙන් 9 වන වසර/8 වන ශ්‍රේණිය සමත්ව සිටිය යුතු ය.

(v) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයා විසින් නිකුත් කරන ලද නිපුණතා සහතිකයක් ලබා තිබිය යුතු ය.

(vi) දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප සහිත ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. කණිෂ්ඨ සේවාවලින් බඳවා ගන්නවුන් තනතුරේ වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වේ. පත්කරනු ලබන සෑම අයෙකුම පරිවාස කාලය අවසන් වීමට පෙර අදාළ කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් විය යුතු ය.

(i) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුම මැනීම පිණිස පවත්වනු ලබන පරීක්ෂණයකින් ;

(ii) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතු ය. මෙම පරීක්ෂණය මෝටර් රථ ප්‍රවාහන දෙපර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ. පරීක්ෂණය සමත්වීමට නොහැකි වීම වැටුප් වර්ධක පමා කිරීමට හේතුවේ.

ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති රෙගුලාසිවලටද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, නියෝගවලට ද, බස්නාහිර පළාත් සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද, සියලුම නිලධාරීහු බැඳී සිටිය යුතු ය.

තනතුර ඉල්ලීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් 2013.03.25 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, ගම්පහ" යන ලිපිනයට එවිය යුතුය.

අදාළ අයදුම්පත්‍රය බහාලනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "රියදුරු තනතුර සඳහාවන අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු ය :-

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිතව);
(iv) මෑතක දී ලබාගත් චරිත සහතිකය ;
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

කේ. එම්. ඩබ්ලිව්. ප්‍රේමචන්ද්‍ර,
නාගරික කොමසාරිස්,
ගම්පහ මහා නගර සභාව - ගම්පහ.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ගම්පහ මහ නගර සභාව

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගම්පහ මහා නගර සභාවේ රියදුරු 11 ආ ශ්‍රේණියේ තනතුර සඳහා අයදුම්පත*

01. *(අ)* මුලකුරු සමඟ නම :————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
03. ස්ථිර ලිපිනය :————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
06. උපන් දිනය :————.
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
07. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද ලියාපදිංචි වීමෙන් ද? :————.
08. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :————.
සමත් වූ ඉහළම වසර/ශ්‍රේණිය :————.
09. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතු ය) :————.
10. සේවා පළපුරුද්ද :————.
11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවත්, සහ පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03-708/3

---

**ගම්පහ මහා නගර සභාව**

111 ශ්‍රේණිය වැඩ/ ක්ෂෙත්‍ර කම්කරු හා III ශ්‍රේණියේ සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීම

මෙම මහා නගර සභාවේ පුරප්පාඩුව පවතින ඉහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ පදිංචි ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම්.—* (i) වැඩ ක්ෂෙත්‍ර කම්කරු සඳහා අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය/6 වන වසර සමත්ව සිටිය යුතු ය.
(ii) සෞඛ්‍ය කම්කරු සඳහා අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ.

02. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.;
(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු, අවුරුදු 45 ට නොවැඩි අයෙකු විය යුතුය.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
(ii) නව බඳවා ගැනීම් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
(iii) වැටුප් ක්‍රමය රු. 11,730 - 10 x 120-10 x 130-10 x 145-12 x 160 - රු. 17,600
(iv) සුදුසුකම් සපුරාලනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබනු ඇත.

04. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ද එවිය යුතු වේ.-

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය තහවුරු කිරීමේ සහතිකය ;
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික ;
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික.

තනතුර ඉල්ලීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර 2013.03.25 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, ගම්පහ" යන ලිපිනයට එවිය යුතුය. අදාළ අයදුම්පත්‍රය බහාලනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.

කේ. එම්. ඩබ්ලිව්. ප්‍රේමචන්ද්‍ර,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව - ගම්පහ.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
ගම්පහ මහ නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*ගම්පහ මහ නගර සභාව*

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කම්කරු III ශ්‍රේණියේ වැඩ ක්ෂෙත්‍ර කම්කරු/සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගැනීම

01. මුලකුරු සමග නම :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
04. ස්ථිර ලිපිනය :————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
07. උපන් දිනය :
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
08. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචි වීමෙන් ද ? :————.
09. අධ්‍යාපන සුදුසුකම්. (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :————
සමත් වූ ඉහළම වසර/ශ්‍රේණිය :————.
10. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය) :————.
11. සේවා පළපුරුද්ද :————.
12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු ඔප්පු වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————,

03-708/2

## කළුතර ප්‍රාදේශීය සභාව

කළුතර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම - මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර | අධ්‍යාපන සුදුසුකම් බාහිර | වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| 201 | රියදුරු II ආ | 03 | අවම වශයෙන් අටවනශ්‍රේණිය/ නවය වසර | අවම වශයෙන් අටවන ශ්‍රේණිය /නවය වසර සමත්වීම සමත්වී තිබීම. | * පෞද්ගලික/කුලී රථ සහ තාරබර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.<br>* වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය)<br>* අවම උස අඩි 05 ක් වත් විය යුතුය.<br>* දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br>* මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. | රු.12,470 - 10 x 130 10 x 145 - 10 x 160 12 x 170 -රු.18,860<br>4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් හා නිපුණත්වය මැනීමේ පරීක්ෂණයක් මගින් |
| 02 | සෞඛ්‍ය කම්කරු III | 15 | අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු නොලැබේ. | අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු නොලැබේ | | රු.11,730 - 10 x 120 -10 x 130 - 10 x 145 -12 x 160 - රු.17,600 | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ. |

*02. බඳවා ගැනීමේ පොදු කොන්දේසි :-*

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(iii) බස්නාහිර පළාත තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතු ය.

(iv) කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(v) යහපත් චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.

(vii) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතු ය.

(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

(ix) කළුතර ප්‍රාදේශීය සභාවේ දැනට අනියම් ආදේශක, කොන්ත්‍රාත් (වැඩ ඒකක) සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

(x) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවාගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීමද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01 ක පරිවාස කාලයකට යටත් වේ.

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.

(iv) මෙම බඳවාගැනීම් කොන්දේසිහි රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ කළුතර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා තිබිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතික,

(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත,

(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,

(v) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (මින් 1 ක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතු ය.)

(vi) පළපුරුද්ද පිළිබඳ සහතිකය,

(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

05. *අයදුම්කළයුතු ආකාරය :-*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කර අයදුම්පත් සකස්කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා අංක 4 ඡේදයේ දක්වා ඇති ලියකියවිලි ද සමගින් 2013.03.29 දින හෝ එදිනට පෙර "ලේකම්, කළුතර ප්‍රාදේශීය සභාව, ගාලු පාර, වස්කඩුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ගීතානි ඩී. ලොකුවැල්ල,<br>
ලේකම්,<br>
කළුතර ප්‍රාදේශීය සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

**කළුතර ප්‍රාදේශීය සභාව**

***.............................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. (i) මුලකුරු සමග නම :————————————.

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම්:————————————.

02. ස්ථිර ලිපිනය:————————————.

03. උපන් දිනය අවුරුද්ද:—————— මාසය:—————— දිනය:——————

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————.

05. ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | |

06. දුරකථන අංකය:————————————.

07. විවාහක/අවිවාහක බව :————————————.

08. අධ්‍යාපන සුදුසුකම් :

8.1 අයදුම්කරුවන් අවසන්වරට සමත්වූ පන්තිය:————————.

8.2 අ.පො.ස. (සා.පෙළ) විභාගය :

(i) වර්ෂය:————————. මාසය:————————.

(ii) විභාග අංකය:————————.

(iii) ප්‍රතිඵල:

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8 | |

8.3 අ.පො.ස. (උ.පෙළ) විභාගය

(i) වර්ෂය:——————. මාසය:——————

(ii) විභාග අංකය:——————. (iii) ප්‍රතිඵල :——————

| විෂය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————

10. වෙනත් සුදුසුකම් :——————

11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද/නැත්ද යන වග : ——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවරුදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමටද යටත්වන බවද මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

---

03-633

## දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාල අවම සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් ස්ථිර, තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හා ව්‍යාපෘති පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | ක්ෂේත්‍ර වැඩ පරිපාලක II ශ්‍රේණිය | 01 | රා.ප.ච. 06/2006 -iv අනුව m.n.1 - 2006A රු.13,120- 145 x 10 -170 x 11 - 240 x 10-320 x 10 - රු.22,040 vii. වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 01. අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ගණිතය/වානිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 06 කින් සාමාර්ථ ලබාගැනීම හෝ |

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | 02. ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයේ එක් වතාවකදී ගණිතය සහ සිංහල දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 06 කින් සාමාර්ථ ලබාගැනීම;<br>හෝ<br>03. පළාත් පාලන ආයතනයක අවුරුදු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි ශ්‍රේණිය සමත්වී තිබීම. |
| 02. | සෞඛ්‍ය පරිපාලක II ශ්‍රේණිය | 01 | රා.ප.ච. 06/2006 iv අනුව m.n. 1 -2006A රු.13,120 - 145 x 10- 170 x 11 - 240 x 10 - 320 x 10 - රු.22,040<br>vii වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 01. අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය ස්වස්ථාව හා ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුළුව යටත් පිරිසෙයින් විෂයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සමත්ව තිබීම ;<br>හෝ<br>02.සිංහල/දෙමළ/ ගණිතය/අංකගණිතය/ වාණිජඅංක ගණිතයස්වස්ථාව හා ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා. පෙ.) විභාගයෙන් සාමාර්ථ ලබා සිටින පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නෙකු වීම;<br>හෝ<br>03.පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නෙකු වීම. |
| 03 | රියදුරු (සැහැල්ලු වාහන රියදුරු II ආ පංතිය) | 01 | රා.ප.ච. 06/2006 - iv අනුව PL 3 -2006A රු. 12,470- 130 x 10 - 145 x 10 160 x 10 - 170 x 12 - රු. 18,860<br>iv. වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 01. අවම වශයෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසල් 8 ශ්‍රේණිය/9 ශ්‍රේණිය සමත් විය යුතුය.<br>*වෘත්තීය සුදුසුකම් :-*<br>(අ) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර් 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳව සහතිකයක් ලබා තිබිය යුතුය. රජයේ හෝ පිළිගත් ආයතනයක සැහැල්ලු වාහන පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබීම.<br>(ආ) දෙපාර්තමේන්තු නියෝජිතයෙකු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු, පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත් වීම. (සහිත මගින් සනාථ කළයුතුය.) |

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | *(ඇ)* අවම උස අඩි පහක් විය යුතු ය.<br>*(ඈ)* දිවා කාලයේ දී රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br>*(ඉ)* මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය. |
| 04. | ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය | 02 | රා.ප.චි. 06/2006 iv අනුව P. L.2 - 2006A රු.12,210 - 130 x 10 145 x 10 - 160 - 170 x 12 රු.18,600 iv වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගයේ දී හෝ අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් කුමන හෝ විෂයන් දෙකක් සමත් විය යුතුය.<br>*වෘත්තිය සුදුසුකම් :-*<br>තනතුරට අදාළ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.) |
| 05. | ආදාහානාගර ක්‍රියාකරු සහායක III ශ්‍රේණිය | 02 | රා.ප.චි. 06/2006 iv අනුව P. L.1- 2006A රු.11,730 - 120 x 10 130 x 10 - 145 x 10 - 160 x 12 - රු.17,600 iv වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 ශ්‍රේණිය සමත් විය යුතුය. වෘත්තීය සුදුසුකම් තිබිය යුතුය. |
| 06. | ක්ෂේත්‍ර වැඩ කම්කරු III ශ්‍රේණිය | 02 | රා.ප.චි. 6/2006 iv අනුව P. L. 1 - 2006A රු.11,730 - 120 x 10 130 x 10 - 145 x 10 160 x 12 - 17,600 iv වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | අවම වශයෙන් 5 ශ්‍රේණිය 6 වසර සමත් විය යුතුය. |
| 07. | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 02 | රා.ප.චි. 06/2006 iv - අනුව P. L. 1 -2006A රු.11,730 - 120 x 10 130 x 10 - 145 x 10- 160 x 12 -රු. 17,600 iv වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 08. | පුස්තකාල සහායක II ශ්‍රේණිය | 02 | රා.ප.චි. 6/2006 iv - අනුව P. L.1 - 2006A රු.13,060 - 130 x 10 - 145 x 10 රු.15,680 vii වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අ.පො.ස. (සා. පෙ) විභාගයෙන් එක්වරකදී කවර හෝ විෂයන් 06 කින් සමත්විය යුතුය. |

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

(i) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ හෝ පළාත් පාලන රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(ii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවන දින වන විට අයදුම්කරු බස්නාහිර පළාතේ අවම වශයෙන් වසර තුනක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(iv) දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි අයදුම්කරුවන් වෙනුවෙන් වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය ශරීර තත්වයකින් යුක්ත විය යුතු ය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුය.
(vii) රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබුවකු නොවිය යුතුය.
(viii) දැනටමත් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, දීමනා මත කොන්ත්‍රාත් හෝ කුලී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය,
(ii) වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ද දායක විය යුතුය.
(iii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන්නේ ය
(iv) මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද රජය හෝ බස්නාහිර පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලය. ඒ අනුව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

(i) විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැණේ.
(අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත)
(ii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

* උප්පැන්න සහතිකය
* ජාතික හැඳුනුම්පත
* අධ්‍යාපන සහතික, ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික
* තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය
* මෑතක දී ලබාගන්නා ලද චරිත සහතික 02 ක්
(එක් චරිත සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මහතාගෙන් ලබා ගත යුතුය. එය ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතුය.)
* වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැක්වෙන සහතිකය
* දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතුය.

(iii) අංක 01, අංක 02 සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.
අංක 04, අංක 05 සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

05. බඳවා ගැනීමේ පරිපාටිය අනුව ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.

06. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

07. *අයදුම්පත් :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2013.03.31 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ “"ලේකම්" දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව, දොඩන්ගොඩ” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. තැපෑලේදී නැති වන සේ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලැබෙන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

එච්. ඒ. සුජන්ත,
ලේකම්,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දොඩන්ගොඩ.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දොඩන්ගොඩ.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව**

................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය

01. (අ) අයදුම්කරුගේ මුලකුරු සමග නම:——————
මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————
02. තැපැල් ලිපිනය:——————
03. දුරකථන අංකය:——————
04. උපන් දිනය: වර්ෂය:——————, මාසය:——————, දිනය:——————,
05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————, මාස:——————, දින:——————,
06. ජාතික හැඳුනුම්පත් අංකය:——————
07. ස්ත්‍රී/පුරුෂ භාවය:——————
08. විවාහක/අවිවාහක:——————
09. ජාතිය:——————
10. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග:——————
11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා එවන්න) :——————
12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,
(i) දැනට දරන තනතුර:——————
(ii) එම තනතුරට පත් වූ දිනය:——————
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ව්‍යාපෘති පදනම මතද):——————
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————

මෙම අයදුම්පතේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව, මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————
අයදුම්කරුගේ අත්සන

දිනය:——————

03-656

---

**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**

මෙම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවත්නා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| රියදුරු | 03 | PL3-2006A | රු. 12,470 - 10x130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | *බාහිර අයදුම්කරුවන් සඳහා*<br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පික විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයන් 06 ක් සමත් විය යුතුය.<br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*<br>(අ) දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. |

| *තනතුරු* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | (ඇ) නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව වෙත අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ ඔවුන් බඳවා ගන්නා අවස්ථාවේ අනුමතව පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.<br><br>(ඈ) *ශිල්පීය නිපුණතාව/ප්‍රවීනත්වය*<br>තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙනයාමට හැකි බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්).<br><br>(ඉ) *පළපුරුද්ද*<br>රියදුරු තනතුර සඳහා වාහන රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතුය.) |
| වැඩ පරිපාලක | 01 | PL2 -2006A | රු. 12,210 - 10x130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 | *බාහිර අයදුම්කරුවන් සඳහා*<br><br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් (02) වත් සමත් වී තිබිය යුතුයි (වෛකල්පික විෂයන් හැර);<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*<br><br>(ආ) පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේනිය (9වසර) සමත් විය යුතුය.<br><br>(ඇ) නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව වෙත අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ ඔවුන් බඳවා ගන්නා අවස්ථාවේ අනුමතව පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.<br><br>(ඈ) *ශිල්පීය නිපුනතාවය/ප්‍රවීණත්වය*<br>තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ N.V.Q 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>(ඉ) *පළපුරුද්ද*<br>අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වසර 2ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |

| *තනතුරු* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| පුස්තකාල සහායක | 10 | PL1-2006A | රු. 11,730 - 10x120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | (අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී විෂයයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුයි (වෛකල්පික විෂයයන් හැර); (ආ) සනීපාරක්ෂක කම්කරුවන් බඳවා ගැනීමේදී අවම අධ්‍යාපන සුදුසුකම වනුයේ රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබීමය. (ඇ) ප්‍රාදේශීය සභාව වෙත අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |
| කාර්යාල කාර්ය සහායක | 02 | | | |
| වැඩ කම්කරු | 09 | | | |
| මුරකරු | 03 | | | |
| සෞඛ්‍ය කම්කරු | 16 | | | |
| ආදාහනාගාර සහායක | 01 | | | |

02. ඉහත සඳහන් සියලු තනතුරු වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුව පාලනය වන අතර, එම පරිපාටි අනුව ඉහත සඳහන් තනතුරු නාම අනුව බඳවා ගනු ලැබුවද සේවක ගණයට අදාළ ඕනෑම තනතුරක රාජකාරී ඉටු කරන ලෙස පත්වීම බලධාරයා/ආයතන ප්‍රධානියාට පැවරිය හැක.

03. *වයස* .- 2013.04.08 දිනට අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි අයකු විය යුතුය. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන්ට ද. මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ටද, ඔවුන්ට පමණක් පෞද්ගලික වන සේ උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

04. *වෙනත් කොන්දේසි* .-
- (i) සෑම තනතුරකටම බඳවා ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ
- (ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- (iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 3ක් තුළ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 3ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.
- (iv) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුත් අයෙකු විය යුතුයි.
- (v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

05. *පත්වීමේ ස්වභාවය* .- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අය කෙරේ. පත්වීම අවු. 03ක පරිවාස කාලයකට යටත් වනු ඇත.

06. තනතුර සඳහා ඉල්ලීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2013.04.08 දින හෝ ඊට ප්‍රථම ලැබෙනසේ "ලේකම්, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව, නාත්තන්ඩිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවින් භාරදිය යුතුය.

07. තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

08. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් ද එවිය යුතුය.
- i. උප්පැන්න සහතිකය;
- ii. අධ්‍යාපන සහතිකය;
- iii. ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය);
- iv. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (ඉන් එකක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියාගේ විය යුතුය.),
- v. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික;
- vi. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

09. *බඳවා ගැනීමේ ක්‍රමය* .- නියමිත සුදුසකම් ඇති අයදුම්කරුවන්ව සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත බඳවා ගැනීම් සිදුකෙරේ. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමින් සේවය කරන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවනු ඇත.

10. අවශ්‍ය අවස්ථාවකදී මෙම බඳවා ගැනීම් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ බලය සහ මෙම නිවේදනයේ සඳහන් කරුණු සංශෝධනය කිරීමේ බලය පත්වීම් බලධාරියා සතුවනු ඇත.

එම්. එම්. විනට් ලලිතා,
ලේකම්,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

2013 පෙබරවාරි මස 21 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ .............................තනතුර සඳහා අයදුම්පත්‍රය

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————————
2. ලිපිනය :————————
3. දුරකථන අංකය:————————
4. උපන් දිනය ඃ
   වර්ෂය:———— මාසය:————— දිනය:————
5. ජාතික හැඳුනුම්පත් අංකය :————————
6. ජාතිය :————————
7. විවාහක/අවිවාහක බව :————————
8. 2013.04.08 වැනි දිනට වයස ඃ
   වර්ෂ:———— මාස:———— දින :—————
9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද:————————
   එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචියෙන් ද :————————
10. ස්ත්‍රී පුරුෂ භාවය:————————
11. අධ්‍යාපන සුදුසුකම්:————————
    (පිටපත් අමුණා එවිය යුතු ය)
12. වෙනත් සුදුසුකම්:————————
13. පළපුරුද්ද:————————
14. ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාල සීමාව:

    ———————සිට ——————— දක්වා

15. පෙර සේවය කර ඇති ස්ථාන :————————
16. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර:————————

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි වන අතර යම් හෙයකින් මා සාවද්‍ය තොරතුරක් සපයා ඇත්නම් පත්වීම් ලබා දීමෙන් අනතුරුව නිසි වන්දියකින් තොරව මා සේවයෙන් ඉවත් කළ හැකි බව ද ඊට පෙර අනාවරණය වුවහොත් මෙම තනතුර ලබා ගැනීම සඳහා මා සුදුස්සෙකු නොවන බව ද මම දනිමි. අයදුම්පත් කැඳවීමේ දැන්වීමේ සඳහන් කරුණු වලට එකඟවන බවත් මෙයින් සහතික කරමි.

පහත සඳහන් ලිපිලේඛනවල ඡායා පිටපත් මෙයට අමුණා ඇත.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතිකය;
3. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික;
4. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
5. ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය);
6. මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්.

————————

අයදුම්කරුගේ අත්සන

දිනය:—————

*දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතනයේ ප්‍රධානියාගේ සහතිකය*

ඉහත අයදුම්කරු ...........................දින සිට මෙම ආයතනයේ ........................වශයෙන් සේවය කරන බවත්, ඔහු/ඇය විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මෙයින් සහතික කරමි.

දිනය:——————

———————,

අත්සන.

07-658

# විවිධ දැන්වීම්

## නාවලපිටිය නගර සභාව

### රථ වාහන ගාස්තු අයකිරීම

නාවලපිටිය නගර සභාවේ ලියාපදිංචි කර ඇති ත්‍රිරෝද රථ/වෑන් රථ/ලොරි රථ සඳහා අය කරනු ලබන මාසික ගාස්තුව 2013.01.28 දින පැවති මහ සභාවේදී පහත සඳහන් ආකාරයට සංශෝධනය කර ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

| *වාහන වර්ගය* | *මාසික ගාස්තුව* |
|---|---|
| | *රු. ශත* |
| ත්‍රිරෝද රථ | 450 0 |
| වෑන් රථ | 600 0 |
| ලොරි රථ | 1,000 0 |

2012 දෙසැම්බර් මස 21 දින *ගැසට් පත්‍රයේ* පළකර ඇති රථ වාහන අය කිරීමේ ගාස්තුව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

නිශාන්ත කුමාර රණසිංහ,
සභාපති,
නාවලපිටිය නගර සභාව.

2013 පෙබරවාරි මස 15 වැනි දින,
නාවලපිටිය නගර සභා කාර්යාලයේ දී ය.

03-624/1

---

## නාවලපිටිය ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

2011.10.06 දිනැති අංක 1726/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් නිවේදනයේ* පළකර ප්‍රකාශයට පත් කර ඇති ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව නාවලපිටිය නගර සභ සීමාව තුළ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු හා ප්‍රදර්ශන බැනර් සඳහා පහත සඳහන් උපලේඛනයේ ගාස්තු අය කිරීමට 2013.01.28 දින පැවති මහ සභාවේ දී තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

නිශාන්ත කුමාර රණසිංහ,
සභාපති,
නාවලපිටිය නගර සභාව.

2013 පෙබරවාරි මස 15 වැනි දින,
නාවලපිටිය නගර සභා කාර්යාලයේ දී ය.

| | *දැන්වීම් පුවරුව පිළිබඳ විස්තරය* | *වර්ග අඩියට මුදල* |
|---|---|---|
| | | *රු. ශත* |
| 1. | විශාල ප්‍රමාණයේ දැන්වීම් පුවරු (වෙළඳසැලක නම් සඳහන් නොවන) | 100 0 |
| 2. | වෙළඳසැලේ නම සමග ව්‍යාපාරික ස්ථානවල සවිකර ඇති දැන්වීම් පුවරු | 50 0 |
| 3. | බිත්තිවල තීන්තවලින් ඇඳ ඇති ප්‍රචාරක දැන්වීම් | 50 0 |
| 4. | තාවකාලික බැනර් (සති 2ක් සඳහා) | 50 0 |
| 5. | වෙළඳසැලේ නාමය ප්‍රදර්ශනය කිරීම සඳහා සෑම වෙළඳසැලකටම 8 x 3 නාම පුවරුවක් ගාස්තුවලින් නිදහස් කෙරේ. | |

2012 දෙසැම්බර් මස 21 වැනි දින *ගැසට් පත්‍රයේ* පළකරන ලද බැනර් සඳහා ගාස්තුව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

03-624/2

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.